# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA


| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2020.12.14 |

# විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය - 2020 ඔක්තෝබර්

## සුවිශේෂ සිදුවීම්

| | 2020 ඔක්තෝබර් | 2020 ජනවාරි - ඔක්තෝබර් |
|---|---|---|
| වෙළඳ ශේෂය | ඇ.ඩො. මිලියන 514<br>2019 ඔක්. ඇ.ඩො. මිලියන 838 | ඇ.ඩො. මිලියන 4,852<br>2019 ජන. - ඔක්. ඇ.ඩො. මිලියන 6,451 |
| වෙළඳ භාණ්ඩ අපනයන | ඇ.ඩො. මිලියන 848<br>2019 ඔක්. ඇ.ඩො. මිලියන 977<br>-13.2% වාර්ෂික ලක්ෂ්‍යමය | ඇ.ඩො. මිලියන 8,293<br>2019 ජන. - ඔක්. ඇ.ඩො. මිලියන 9,961<br>-16.7% වාර්ෂික ලක්ෂ්‍යමය |
| වෙළඳ භාණ්ඩ ආනයන | ඇ.ඩො. මිලියන 1,363<br>2019 ඔක්. ඇ.ඩො. මිලියන 1,816<br>-24.9% වාර්ෂික ලක්ෂ්‍යමය | ඇ.ඩො. මිලියන 13,145<br>2019 ජන. - ඔක්. ඇ.ඩො. මිලියන 16,412<br>-19.9% වාර්ෂික ලක්ෂ්‍යමය |

**සංචාරක ඉපැයීම්**

2020 ඔක්.: -

2020 ජන. - ඔක්.: ඇ.ඩො. මිලියන 956 (-66.1% වාර්ෂික ලක්ෂ්‍යමය)

**විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ**

2020 ඔක්.: ඇ.ඩො. මිලියන 631 (3.9% වාර්ෂික ලක්ෂ්‍යමය)

2020 ජන. - ඔක්.: ඇ.ඩො. මිලියන 5,680 (2.6% වාර්ෂික ලක්ෂ්‍යමය)

| කොළඹ කොටස් වෙළඳපොළ (ප්‍රාථමික සහ ද්විතීයික වෙළඳපොළ-ශුද්ධ) | රාජ්‍ය සුරැකුම්පත් (ශුද්ධ) | දළ නිල සංචිත | විනිමය අනුපාතිකය (ඇ.ජ.ඩොලරයට රුපියල්) |
|---|---|---|---|
| 2020 ඔක්.: ඇ.ඩො. මිලියන 21<br>2020 ජන. - ඔක්.: ඇ.ඩො. මිලියන -194 | 2020 ඔක්.: ඇ.ඩො. මිලියන -20<br>2020 ජන. - ඔක්.: ඇ.ඩො. මිලියන -532 | 2020 ඔක්. අග: ඇ.ඩො. බිලියන 5.9<br>(ආනයනික මාස 4.2) | 2019 දෙසැ. අග: 181.6340<br>2020 ඔක්. අග: 184.2769 |













ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වෙළඳ භාණ්ඩ ක්‍රියාකාරිත්වය පිළිබඳව වැඩිදුර තොරතුරු ඇතුළත් 'මාසික වෙළඳ විවරණිකාව' ප්‍රකාශයට පත් කරනු ලබන අතර එය ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.
සංඛ්‍යාති > ආර්ථික දර්ශක > මාසික වෙළඳ විවරණිකාව (https://www.cbsl.gov.lk/si/node/6181).

## සමස්ත නිරීක්ෂණ

එ.ජ. ඩොලර් බිලියන 1.0ක කල්පිරුණු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරය සාර්ථකව ආපසු ගෙවීමත් සමඟ 2020 ඔක්තෝබර් මාසයේ දී ශ්‍රී ලංකාවේ විදේශීය අංශය බාහිර කම්පනයන්ට මුහුණ දීමේ හැකියාව තවදුරටත් පිළිබිඹු කළේය. වෙළඳ හිඟය තවදුරටත් පහත වැටීම, විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ වැඩි වීම සහ එම කරුණුවල ප්‍රතිඵලයක් ලෙස දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි ඇති වූ ස්ථාවරත්වය යනාදියෙහි බලපෑම මාසය තුළ දී විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය කෙරෙහි හිතකර ලෙස දායක විය. ගෝලීය බොරතෙල් මිල අඩු මට්ටමක පැවතීම සහ රජය විසින් පනවා ඇති ආනයන සීමා කිරීම් හේතුවෙන් ආනයන අඛණ්ඩව අඩු වී ඇති අතර, ඔක්තෝබර් මස මුල සිට නැවත කොවිඩ්-19 රෝගීන් වර්තා වීම හේතුවෙන් දේශීය නිෂ්පාදන සහ උපකාරක සේවාවන් වෙත ඇති වූ බාධාවන් සහ විදේශීය ගැනුම්කරුවන් වෙතින් වූ දුර්වල ඉල්ලුම හේතුවෙන් 2020 ඔක්තෝබර් මාසයේ දී අපනයන පහත වැටුණි. විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව මෙම මාසය තුළදී ද අඛණ්ඩව වර්ධනයක් වාර්තා කළේය. මූල්‍ය ගිණුම සැලකීමේ දී, 2020 ඔක්තෝබර් මස කොළඹ කොටස් වෙළඳපොළ වෙත විදේශීය ආයෝජන සුළු ශුද්ධ  ලැබීමක් වාර්තා කළ අතර, රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ සුළු ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය. ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරය ආපසු ගෙවා තිබියදීත් ශ්‍රී ලංකාව 2020 ඔක්තෝබර් අවසන් වන විට එ.ජ. ඩොලර් බිලියන 5.9ක දළ නිල සංචිත ප්‍රමාණයක් පවත්වාගෙන ගියේය. මේ අතර, දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත වූ ශුද්ධ ලැබීම් විනිමය අනුපාතිකයට ඇති පීඩනය ලිහිල් කළ අතර, ඒ හේතුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවට විදේශ විනිමය අවශෝෂණය කර ගැනීමට අවකාශ සැලසුණි. විදේශීය අංශයේ ප්‍රවණතාවයන් පිළිබිඹු කරමින්, 2020 ඔක්තෝබර් මාසය තුළ ශ්‍රී ලංකා රුපියල සුළු වශයෙන් අතිප්‍රමාණය විය.

**සංඛ්‍යා සටහන 1: විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශය (අ)**

| කාණ්ඩය | 2019 ඔක්. එ.ජ.ඩො. මිලියන | 2020 ඔක්. එ.ජ.ඩො. මිලියන | වෙනස (%) | 2019 ජන.- ඔක්. එ.ජ.ඩො. මිලියන | 2020 ජන.- ඔක්. එ.ජ.ඩො. මිලියන | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩ අපනයන | 977 | 848 | -13.2 | 9,961 | 8,293 | -16.7 |
| වෙළඳ භාණ්ඩ ආනයන | 1,816 | 1,363 | -24.9 | 16,412 | 13,145 | -19.9 |
| වෙළඳ ශේෂය | -838 | -514 | | -6,451 | -4,852 | |
| සංචාරක ඉපැයීම් | 224 (ආ) | - | - | 2,818 (ආ) | 956 (ඇ) | -66.1 |
| විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ | 607 | 631 | 3.9 | 5,537 | 5,680 | 2.6 |
| කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ලැබීම් (ශුද්ධ) (ඈ) | -10 | 21 | | 5 | -194 | |
| රාජ්‍ය අංශයේ ලැබීම් (දළ) | 221 | 240 | | 6,266 | 1,799 | |
| භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර (දළ) | 57 | 1 | | 511 | 103 | |
| දිගුකාලීන ණය (දළ) | 164 | 239 | | 1,356 | 1,697 | |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර (දළ) | - | - | | 4,400 | - | |
| විදේශ සෘජු ආයෝජන (දළ) (ඉ) | | | | 535 | 345 | |
| සමස්ත ශේෂය | | | | 667 | -2,083 | |

**මූලයන්**: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, කොළඹ කොටස් වෙළඳපොළ, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික

(ආ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2019 වර්ෂය සඳහා සිදු කළ සමීක්ෂණයට අනුව ඇස්තමේන්තු කළ සංචාරකයකු මෙරට ගත කරන සාමාන්‍ය කාලය සහ සංචාරකයකුගේ සාමාන්‍ය දෛනික වියදමට අනුව සංශෝධිතය.

(ඇ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2020 වර්ෂය සඳහා එහි සමීක්ෂණ ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසු මෙම තාවකාලික ඇස්තමේන්තු සංශෝධනය විය හැකිය.

(ඈ) ප්‍රාථමික සහ ද්විතීයික ගනුදෙනු ඇතුළත් වේ.

(ඉ) සෑම කාලපරිච්ඡේදයක් සඳහාම දත්ත පවතිනුයේ පළමු මාස හය සඳහා වන අතර, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් වාර්තා කළ පරිදි සෘජු ආයෝජන සමාගම් වෙත වූ විදේශීය ණය සහ කොටස් වෙළඳපොළ වෙත වූ ශුද්ධ සෘජු ආයෝජන ඇතුළත් වේ.

## වෙළඳ ශේෂය සහ වෙළඳ මිල අනුපාතය

**අපනයන ආදායම පහත වැටීම අභිබවා ආනයන වියදම පහත වැටීම හේතුවෙන් 2020 වසරේ ඔක්තෝබර් මාසයේ දී වෙළඳ ගිණුමේ හිඟය අඩු විය.** 2020 වසරේ ඔක්තෝබර් මාසයේ දී වෙළඳ ගිණුමේ හිඟය එ.ජ.ඩොලර් මිලියන 514ක් වූ අතර, එය 2019 වසරේ ඔක්තෝබර් මාසයේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 838ක වෙළඳ හිඟයට සාපේක්ෂව කැපී පෙනෙන ලෙස පහළ අගයකි. සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ දී වෙළඳ ශේෂය වර්ධනය වීම සඳහා අපනයන පහත වැටීම (එ.ජ.ඩොලර් මිලියන 129කින්) අභිබවා ආනයන පහත වැටීම (එ.ජ.ඩොලර් මිලියන 453කින්) හේතු විය. 2020 වසරේ ජනවාරි සිට ඔක්තෝබර් දක්වා කාලපරිච්ඡේදය තුළ දී සමස්ත වෙළඳ හිඟය 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ දී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 6,451ක සිට එ.ජ.ඩොලර් මිලියන 4,852ක් දක්වා අඩු විය. මෙම කාලපරිච්ඡේදය තුළ දී වෙළඳ හිඟය අඩු වීම සඳහා බලපෑ ප්‍රධාන අයිතම රූපසටහන 01 මගින් දැක්වේ.

මේ අතර, අපනයන හා ආනයන මිල ගණන් අතර අනුපාතය දැක්වෙන වෙළඳ මිල අනුපාතය, 2019 වසරේ ඔක්තෝබර් මාසයට සාපේක්ෂව 2020 වසරේ ඔක්තෝබර් මාසයේ දී සියයට 4.0කින් ඉහළ ගිය අතර, මේ සඳහා අපනයන මිල ගණන් පහත වැටීම අභිබවා ආනයන මිල ගණන් පහත වැටීම හේතු විය.

**රූප සටහන 1: 2020 වසරේ ජනවාරි - ඔක්තෝබර් කාලපරිච්ඡේදය තුළ වෙළඳ හිඟය අඩු වීම සඳහා දායක වූ ප්‍රධාන අයිතම (එ.ජ. ඩො. මිලියන)**




**මූලයන්**: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 2: මාසික වෙළඳ හිඟය (2019 -2020)**




**මූලයන්**: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 3: වෙළඳ මිල අනුපාතය (2019 -2020)**




**මූලය**: ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ අපනයන ක්‍රියාකාරිත්වය

**කෘෂිකාර්මික නිෂ්පාදිත අපනයන අඛණ්ඩව ඉහළ ගිය ද, කොවිඩ්-19 රෝගීන් නැවත වාර්තා වීමට පටන් ගැනීම හේතුවෙන් 2020 වසරේ ඔක්තෝබර් මාසයේ දී වෙළඳ භාණ්ඩ අපනයන ආදායම පහත වැටුණි.** 2020 වසරේ ඔක්තෝබර් මාසයේ දී වෙළඳ භාණ්ඩ අපනයන ආදායම 2019 වසරේ ඔක්තෝබර් මාසයට සාපේක්ෂව මෙන්ම 2020 වසරේ සැප්තැම්බර් මාසයට සාපේක්ෂව ද පහත වැටුණු අතර, මේ සඳහා වසංගතයෙහි දෙවැනි රැල්ල හදිසියේම පැතිරී යෑම හේතුවෙන් රට තුළ සැලසුම් කළ නිෂ්පාදන සහ උපකාරක සේවා, විශේෂයෙන් ඇඟලුම් කර්මාන්තය කෙරෙහි බාධා පැමිණීම හේතු විය. තවද, බොහෝ රටවල් කොවිඩ්-19 දෙවැනි රැල්ලට මුහුණ දීමත් සමඟ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන සඳහා පැවති අහිතකර ගෝලීය වෙළඳපොළ තත්ත්වයන් තවදුරටත් තීව්‍ර වූ අතර, මේ නිසා ශ්‍රී ලංකාවේ අපනයන සඳහා වූ ඉල්ලුම පහත වැටුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස, 2020 වසරේ ඔක්තෝබර් මාසයේ දී අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 848ක් දක්වා 2019 වසරේ ඔක්තෝබර් මාසයට සාපේක්ෂව සියයට 13.2කින් සහ 2020 වසරේ සැප්තැම්බර් මාසයට සාපේක්ෂව සියයට 15.2කින් පහත වැටුණි.

2020 වසරේ ඔක්තෝබර් මාසයේ දී කාර්මික භාණ්ඩ අපනයන ආදායම පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 16.9කින් පහත වැටුණු අතර, මේ සඳහා රෙදිපිළි හා ඇඟලුම් අපනයන මෙන්ම මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ, ඛනිජ තෙල් නිෂ්පාදිත, සහ යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ වැනි කුඩා අංශ බොහෝමයක දුර්වල ක්‍රියාකාරිත්වය හේතු විය. ඇමෙරිකා එක්සත් ජනපදය, යුරෝපා වෙළඳපොළ සහ වෙනත් වෙළඳපොළ වෙත වූ අපනයන පහත වැටීම හේතුවෙන් රෙදිපිළි හා ඇඟලුම් අපනයන ආදායම සියයට 18.9කින් පහත වැටුණි. කෙසේ වුවද, ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත සහ රබර් නිෂ්පාදිත අපනයන ආදායම ඉහළ ගිය අතර, මේ සඳහා එම කාණ්ඩ යටතේ වර්ගකර ඇති පෞද්ගලික සනීපාරක්ෂක උපකරණ සඳහා අදාළ උප කාණ්ඩ වන ප්ලාස්ටික් ඇඳුම් උපාංග සහ ශල්‍ය හා වෙනත් අත්වැසුම් අපනයන ඉහළ යෑම හේතු විය.

2020 වසරේ ඔක්තෝබර් මාසයේ දී කෘෂිකාර්මික භාණ්ඩ අපනයන ආදායම පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 0.6කින් සුළු වශයෙන් ඉහළ ගිය අතර, මේ සඳහා පොල් අපනයන (ප්‍රධාන වශයෙන් පොල් තෙල් සහ පොල් මද ආශ්‍රිත නොවන නිෂ්පාදිත), කුළුබඩු (ප්‍රධාන වශයෙන් කුරුඳු) සහ ස්වාභාවික රබර් අපනයන ඉහළ යෑම ප්‍රධාන වශයෙන් හේතු විය. මේ අතර, තේ අපනයන මිල ගණන් ඉහළ ගිය ද, අපනයන පරිමාව පහත වැටීම හේතුවෙන් තේ අපනයන ආදායම සියයට 1.4කින් පහත වැටුණි. මුහුදු ආහාර, සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත (ප්‍රධාන වශයෙන් පලතුරු සහ ආහාරයට ගත හැකි ඇට වර්ග) සහ සකස් නොකළ දුම්කොළ 2019 වසරේ ඔක්තෝබර් මාසයට සාපේක්ෂව සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ දී අපනයන පහත වැටුණු කෘෂිකාර්මික අපනයන කාණ්ඩ විය.

2019 වසරේ ඔක්තෝබර් මාසයට සාපේක්ෂව 2020 වසරේ ඔක්තෝබර් මාසයේ දී ඛනිජ අපනයන සියයට 36.8කින් පහත වැටුණි. ක්වාට්ස් සහ ග්‍රැනයිට් වැනි පාෂාණ හා ගල් වර්ග අපනයන ඉහළ ගිය අතර, ගැෆයිට් කුඩු සහ ස්වාභාවික වැලි වර්ග අපනයන පහත වැටුණි. තවද, ටයිටේනියම් සහ සර්කෝනියම් වැනි යපස් හා යබොර අපනයන පහත වැටුණි.

2020 වසරේ ඔක්තෝබර් මාසයේ දී පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව අපනයන පරිමා දර්ශකය සහ ඒකක මිල දර්ශකය පිළිවෙලින් සියයට 2.8කින් සහ සියයට 10.6කින් පහත වැටුණු අතර, මෙමගින්, අපනයන ආදායම පහත වැටීම සඳහා අපනයන පරිමාව සහ මිල ගණන් යන සාධක දෙක ම පහත වැටීම හේතු වූ බව පිළිබිඹු වේ.

**රූප සටහන 4: මාසික අපනයන ක්‍රියාකාරිත්වය**




**මූලයන්** : ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 5: මාසික අපනයන පරිමා දර්ශකය**




**මූලය**: ශ්‍රී ලංකා මහ බැංකුව

## සංඛ්‍යා සටහන 2: වෙළඳ භාණ්ඩ අපනයන ආදායම (අ)

| කාණ්ඩය | ඔක්. 2019 (එ.ජ.ඩො. මිලියන) | ඔක්. 2020 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | ජන.- ඔක්. 2019 (එ.ජ.ඩො. මිලියන) | ජන.- ඔක්. 2020 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. කාර්මික අපනයන** | **762.1** | **633.3** | **-16.9** | **7,839.8** | **6,313.2** | **-19.5** |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 38.7 | 39.1 | 1.0 | 376.0 | 387.7 | 3.1 |
| සත්ත්ව ආහාර | 14.2 | 4.7 | -66.7 | 109.1 | 88.6 | -18.8 |
| රෙදිපිළි හා ඇඟලුම් | 441.6 | 358.2 | -18.9 | 4,628.4 | 3,645.0 | -21.2 |
| එයින්, ඇඟලුම් | 407.9 | 325.7 | -20.2 | 4,305.6 | 3,245.4 | -24.6 |
| රෙදිපිළි | 25.4 | 26.3 | 3.7 | 235.8 | 207.9 | -11.8 |
| අනෙකුත් නිම කළ රෙදිපිළි ද්‍රව්‍ය | 8.3 | 6.2 | -25.1 | 87.0 | 191.8 | 120.3 |
| රබර් නිෂ්පාදිත | 70.3 | 77.9 | 10.8 | 732.5 | 644.8 | -12.0 |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 30.0 | 10.4 | -65.3 | 254.6 | 133.3 | -47.6 |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 33.4 | 20.8 | -37.9 | 341.4 | 266.1 | -22.1 |
| ප්‍රවාහන උපකරණ | 7.8 | 4.2 | -45.3 | 135.2 | 58.7 | -56.6 |
| ඛනිජතෙල් නිෂ්පාදිත | 41.5 | 24.4 | -41.3 | 409.3 | 321.1 | -21.5 |
| රසායනික නිෂ්පාදිත | 14.5 | 16.0 | 10.4 | 148.7 | 139.7 | -6.0 |
| දැව හා කඩදාසි නිෂ්පාදිත | 10.3 | 8.1 | -21.5 | 111.7 | 82.5 | -26.1 |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 5.4 | 2.6 | -52.2 | 38.5 | 38.9 | 0.9 |
| සම් භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 7.0 | 3.0 | -57.3 | 89.2 | 47.0 | -47.3 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 6.2 | 42.6 | 582.6 | 61.3 | 149.3 | 143.4 |
| මූල ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 13.4 | 5.8 | -56.8 | 148.7 | 90.4 | -39.2 |
| පිඟන්මැටි නිෂ්පාදිත | 2.2 | 1.7 | -22.5 | 25.0 | 18.2 | -27.0 |
| වෙනත් කාර්මික අපනයන | 25.7 | 13.9 | -46.0 | 230.3 | 202.1 | -12.2 |
| **2. කෘෂිකාර්මික අපනයන** | **210.2** | **211.4** | **0.6** | **2,079.1** | **1,949.9** | **-6.2** |
| තේ | 113.8 | 112.2 | -1.4 | 1,139.1 | 1,031.8 | -9.4 |
| රබර් | 1.2 | 2.4 | 106.4 | 21.3 | 22.3 | 4.9 |
| පොල් | 26.3 | 32.5 | 23.7 | 284.8 | 289.8 | 1.8 |
| කුළුබඩු | 32.6 | 33.6 | 3.0 | 267.4 | 266.7 | -0.3 |
| එළවළු | 2.9 | 4.4 | 52.2 | 27.0 | 32.9 | 22.0 |
| සකස් නොකළ දුම්කොළ | 2.2 | 2.0 | -7.0 | 28.0 | 21.7 | -22.4 |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 12.1 | 8.7 | -28.0 | 92.1 | 119.8 | 30.0 |
| මුහුදු ආහාර | 19.2 | 15.6 | -18.9 | 219.6 | 165.0 | -24.9 |
| **3. ඛනිජ අපනයන** | **3.5** | **2.2** | **-36.8** | **28.1** | **18.1** | **-35.6** |
| **4. වර්ග නොකළ අපනයන** | **1.5** | **1.6** | **3.4** | **14.2** | **12.2** | **-13.8** |
| **මුළු අපනයන** | **977.3** | **848.4** | **-13.2** | **9,961.3** | **8,293.4** | **-16.7** |

(අ) තාවකාලික

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්, ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය

**2020 වසරේ ඔක්තෝබර් මාසයේදී වෙළඳ භාණ්ඩ ආනයන වියදම සැලකිය යුතු ලෙස පහත වැටුණු අතර, මේ සඳහා බොරතෙල් මිල ගණන් පහත වැටීම සහ රජය මගින් අත්‍යවශ්‍ය නොවන ආනයන සීමා කිරීම හේතු විය.** 2020 වසරේ මාර්තු මාසයේ සිට දක්නට ලැබුණු පරිදි පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව ආනයන වියදම පහත වැටීමේ ප්‍රවණතාවය තවදුරටත් පවත්වා ගනිමින් 2020 වසරේ ඔක්තෝබර් මාසයේ දී වෙළඳ භාණ්ඩ ආනයන වියදම එ.ජ.ඩොලර් මිලියන 1,363ක් දක්වා 2019 වසරේ ඔක්තෝබර් මාසයට සාපේක්ෂව සියයට 24.9කින් පහත වැටුණි. 2020 වසරේ ඔක්තෝබර් මාසයේ දී ආනයන වියදම පහත වැටීම සඳහා පාරිභෝගික භාණ්ඩ, අන්තර් භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ යන සියලුම ප්‍රධාන කාණ්ඩවල ආනයන පහත වැටීම හේතු විය.

2019 වසරේ ඔක්තෝබර් මාසයට සාපේක්ෂව 2020 වසරේ ඔක්තෝබර් මාසයේ දී පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම සියයට 34.4කින් පහත වැටුණු අතර, මේ සඳහා ප්‍රධාන වශයෙන් පෞද්ගලික භාවිතය සඳහා වූ රථවාහන ආනයන පහත වැටීම හේතු විය. ආහාර හා පාන වර්ග ආනයන වියදම සියයට 4.7කින් පහත වැටුණි. එළවළු, පලතුරු, මුහුදු ආහාර, කිරි නිෂ්පාදිත, පාන වර්ග සහ ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත ආනයන වියදම පහත වැටුණි. එහෙත් සීනි, තෙල් හා මේද වර්ග (ප්‍රධාන වශයෙන් පොල්තෙල්) සහ කුළුබඩු (ප්‍රධාන වශයෙන් මිරිස් සහ කොත්තමල්ලි) ආනයන ඉහළ ගියේය. 2020 වසරේ ඔක්තෝබර් මාසයේ දී ගෝලීය වෙළෙඳපොළ තුළ සීනි මිල ගණන් 2020 වසරේ මාර්තු මාසයේ සිට මෙන්ම 2019 වසරේ ඔක්තෝබර් මාසයට සාපේක්ෂව ද ඉහළම අගයක් වාර්තා කළ අතර, මේ සඳහා වැසි අඩු තත්ත්වය හේතුවෙන් සීනි නිෂ්පාදනය කරන ප්‍රධාන රටවල නිෂ්පාදනය අඩුවීම හේතු විය. 2019 වසරේ ඔක්තෝබර් මාසයට සාපේක්ෂව 2020 වසරේ ඔක්තෝබර් මාසයේ දී සීනි සහ පොල්තෙල් යන අයිතම දෙකෙහි ම ආනයන පරිමාව හා ඒකක මිල ගණන් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. ප්‍රධාන වශයෙන් පෞද්ගලික රථවාහන ඇතුළුව බොහෝ අයිතම ආනයනය පහත වැටීම හේතුවෙන් ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම සියයට 49.4කින් පහත වැටුණි. මෙලෙස පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පහත වැටීම සඳහා ආනයන සීමා කිරීම් ද අර්ධ වශයෙන් හේතු විය. බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත වැනි ඇතැම් සීමා කිරීම් රහිත අයිතම ආනයන වියදම ද පහත වැටුණි.

2019 වසරේ ඔක්තෝබර් මාසයට සාපේක්ෂව 2020 වසරේ ඔක්තෝබර් මාසයේ දී අන්තර් භාණ්ඩ ආනයන වියදම සියයට 21.4කින් පහත වැටුණු අතර, මේ සඳහා ඉන්ධන ආනයන වියදම සියයට 27.5කින් පහත වැටීම සහ ඇඟලුම් නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන රෙදිපිළි හා රෙදිපිළි උපාංග ආනයන වියදම සියයට 21.3කින් පහත වැටීම හේතු විය. අන්තර් භාණ්ඩ යටතේ වර්ගකර ඇති අනෙකුත් විශාල හා කුඩා උප කාණ්ඩ සියල්ලකම පාහේ ආනයන වියදම පහත වැටුණි. ඉන්ධන ආනයන වියදම පහත වැටුණු අතර, මේ සඳහා ගෝලීය වෙළඳපොළෙහි ඉන්ධන මිල ගණන් පහත වැටීම හේතුවෙන් බොරතෙල්, පිරිපහදු කළ ඛනිජ තෙල් සහ ගල් අඟුරු වැනි ඉන්ධන යටතේ වර්ග කර ඇති සියලුම කාණ්ඩවල ආනයන මිල ගණන් පහත වැටීම හේතුවිය. බොරතෙල් බැරලයක් සඳහා ආනයන මිලෙහි සාමාන්‍යය 2019 වසරේ ඔක්තෝබර් මාසයේ දී දක්නට ලැබුණු එ.ජ.ඩොලර් 66.06ට සාපේක්ෂව 2020 වසරේ ඔක්තෝබර් මාසයේ දී එ.ජ.ඩොලර් 41.77ක් විය. 2019 වසරේ ඔක්තෝබර් මාසයට සාපේක්ෂව 2020 වසරේ ඔක්තෝබර් මාසයේ දී බොරතෙල් ආනයන පරිමාව පහත වැටුණු අතර, පිරිපහදු කළ ඛනිජ තෙල් සහ ගල් අඟුරු ආනයන පරිමා ඉහළ ගියේය.

2019 වසරේ ඔක්තෝබර් මාසයට සාපේක්ෂව 2020 වසරේ ඔක්තෝබර් මාසයේ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම සියයට 24.9කින් පහත වැටුණු අතර, මේ සඳහා යන්ත්‍රසූත්‍ර හා උපකරණ, ගොඩනැගිලි ද්‍රව්‍ය සහ ප්‍රවාහන උපකරණ යන ප්‍රධාන කාණ්ඩ තුනෙහි මෙන්ම එම කාණ්ඩ යටතේ වර්ග කර ඇති උපකාණ්ඩ සියල්ලකම පාහේ ආනයන පහත වැටීම හේතු විය. මේ සඳහා ආනයන සීමාකිරීම් ද අර්ධ වශයෙන් හේතු විය.

2020 වසරේ ඔක්තෝබර් මාසයේ දී පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව ආනයන පරිමා දර්ශකය සහ ඒකක මිල දර්ශකය පිළිවෙලින් සියයට 12.6කින් සහ සියයට 14.1කින් පහත වැටුණු අතර, මෙමඟින් ආනයන වියදම පහත වැටීම සඳහා ආනයන පරිමාව සහ මිල ගණන් යන සාධක දෙකම පහත වැටීම හේතු වූ බව පිළිබිඹු වේ.

**රූප සටහන 6: මාසික ආනයන ක්‍රියාකාරීත්වය**




**මූලයන්**: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 7: මාසික ආනයන පරිමා දර්ශකය**




**මූලය**: ශ්‍රී ලංකා මහ බැංකුව

## සංඛ්‍යා සටහන 3: වෙළඳ භාණ්ඩ ආනයන වියදම (අ)

| කාණ්ඩය | ඔක්. 2019 (එ.ජ.ඩො. මිලියන) | ඔක්. 2020 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | ජන.- ඔක්. 2019 (එ.ජ.ඩො. මිලියන) | ජන.- ඔක්. 2020 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | **383.3** | **251.6** | **-34.4** | **3,195.3** | **2,818.4** | **-11.8** |
| ආහාර හා පාන වර්ග | 128.9 | 122.8 | -4.7 | 1,138.2 | 1,271.7 | 11.7 |
| ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 4.0 | 3.3 | -18.2 | 28.8 | 27.4 | -5.0 |
| කිරි ආශ්‍රිත නිෂ්පාදිත | 25.5 | 20.3 | -20.2 | 250.4 | 273.3 | 9.1 |
| එළවළු (ආ) | 29.6 | 17.6 | -40.7 | 237.2 | 280.1 | 18.1 |
| මුහුදු ආහාර | 19.0 | 11.5 | -39.7 | 179.0 | 164.9 | -7.9 |
| සීනි හා රසකැවිලි | 17.5 | 32.8 | 87.3 | 160.2 | 233.4 | 45.7 |
| කුළුබඩු | 10.6 | 11.7 | 10.5 | 90.1 | 106.0 | 17.7 |
| වෙනත් ආහාර හා පාන වර්ග | 22.7 | 25.8 | 13.4 | 192.5 | 186.6 | -3.0 |
| ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ | 254.4 | 128.7 | -49.4 | 2,057.1 | 1,546.7 | -24.8 |
| පෞද්ගලික රථවාහන | 84.6 | 0.5 | -99.4 | 651.0 | 281.9 | -56.7 |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 54.2 | 51.9 | -4.3 | 453.6 | 493.6 | 8.8 |
| ගෘහ උපකරණ | 19.2 | 16.8 | -12.5 | 165.7 | 134.2 | -19.0 |
| රෙදිපිළි හා උපාංග | 26.9 | 12.8 | -52.4 | 230.6 | 165.9 | -28.1 |
| විදුලි සන්දේශ උපකරණ | 25.9 | 15.1 | -41.6 | 199.4 | 210.7 | 5.7 |
| ගෘහ හා දැව භාණ්ඩ | 17.7 | 13.5 | -23.6 | 140.4 | 118.0 | -16.0 |
| වෙනත් ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ | 26.0 | 18.1 | -30.3 | 216.4 | 142.4 | -34.2 |
| **2. අන්තර් භාණ්ඩ** | **1,040.2** | **817.5** | **-21.4** | **9,420.7** | **7,393.2** | **-21.5** |
| ඉන්ධන | 308.3 | 223.4 | -27.5 | 3,238.8 | 2,128.6 | -34.3 |
| එයින්, බොරතෙල් | 95.0 | 28.0 | -70.5 | 824.3 | 479.2 | -41.9 |
| පිරිපහදු කළ ඛනිජතෙල් | 192.4 | 172.0 | -10.6 | 2,245.2 | 1,481.3 | -34.0 |
| ගල්අඟුරු | 20.9 | 23.4 | 12.2 | 169.2 | 168.1 | -0.6 |
| දියමන්ති, අගනා ගල් වර්ග හා ලෝහ වර්ග | 19.0 | 13.5 | -28.8 | 158.1 | 80.7 | -48.9 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 277.1 | 218.1 | -21.3 | 2,404.2 | 1,883.6 | -21.7 |
| කඩදාසි හා ඝන කඩදාසි | 46.6 | 35.0 | -24.9 | 382.7 | 312.1 | -18.4 |
| කෘෂිකාර්මික යෙදවුම් | 14.9 | 14.2 | -4.6 | 155.6 | 161.8 | 4.0 |
| තිරිඟු හා ඉරිඟු | 33.0 | 24.1 | -27.1 | 266.9 | 314.1 | 17.7 |
| මූල ලෝහ | 69.1 | 63.4 | -8.2 | 477.8 | 385.4 | -19.3 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 61.0 | 51.8 | -15.1 | 506.1 | 440.3 | -13.0 |
| රසායනික නිෂ්පාදිත | 76.9 | 71.8 | -6.6 | 698.2 | 669.9 | -4.1 |
| පොහොර | 27.4 | 22.5 | -18.1 | 194.9 | 161.5 | -17.1 |
| රබර් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 24.6 | 17.4 | -29.3 | 199.5 | 182.7 | -8.4 |
| ඛනිජ නිෂ්පාදිත | 26.4 | 11.5 | -56.5 | 185.4 | 143.5 | -22.6 |
| වෙනත් අන්තර් භාණ්ඩ | 56.1 | 50.9 | -9.2 | 552.6 | 529.0 | -4.3 |
| **3. ආයෝජන භාණ්ඩ** | **391.0** | **293.5** | **-24.9** | **3,789.4** | **2,920.9** | **-22.9** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 218.2 | 183.0 | -16.1 | 2,034.9 | 1,764.7 | -13.3 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 133.8 | 87.5 | -34.6 | 1,277.2 | 852.2 | -33.3 |
| ප්‍රවාහන උපකරණ | 38.5 | 22.8 | -40.9 | 471.9 | 301.3 | -36.1 |
| වෙනත් ආයෝජන භාණ්ඩ | 0.4 | 0.2 | -44.2 | 5.3 | 2.6 | -50.5 |
| **4. වර්ග නොකළ ආනයන** | **1.2** | **0.2** | **-83.5** | **6.4** | **12.4** | **92.9** |
| **මුළු ආනයන** | **1,815.7** | **1,362.8** | **-24.9** | **16,411.8** | **13,145.0** | **-19.9** |
| **ඉන්ධන නොවන ආනයන** | **1,507.4** | **1,139.4** | **-24.4** | **13,173.0** | **11,016.4** | **-16.4** |

(අ) තාවකාලික
(ආ) පරිප්පු, ළූණු, අර්තාපල්, රනිල කුලයට අයත් එළවළු සහ වෙනත් එළවළු ඇතුළත් වේ.

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා අයි.ඕ.සී. සමාගම, ශ්‍රී ලංකා මහ බැංකුව

## ජංගම ගිණුම වෙත වාර්තා වූ අනෙකුත් ප්‍රධාන ලැබීම්

**2020 වසරේ ඔක්තෝබර් මාසයේ දී අඛණ්ඩව හත්වන මාසයටත් සංචාරක පැමිණීම් කිසිවක් වාර්තා නොවීය.** 2020 වසරේ ඔක්තෝබර් මාසයෙන් අවසන් වූ මාස දහය තුළ දී මුළු සංචාරක පැමිණීම් ප්‍රමාණය, 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ 1,495,055ට සාපේක්ෂව 507,311ක මට්ටමක පැවතුණි. ඒ අනුව, සංචාරකයින්ගේ පැමිණීම මත පදනම්ව ඇස්තමේන්තුගත කෙරෙන සංචාරක ඉපැයීම් 2020 වසරේ ඔක්තෝබර් මාසය දක්වා කාලය තුළ දී එ.ජ. ඩොලර් මිලියන 956ක් වූ අතර, එය 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේදී සියයට 66.1ක අඩු වීමකි.

**විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ අඛණ්ඩව පස්වන මාසයට ද ඉහළ ගියේය.** 2020 වසරේ ඔක්තෝබර් මාසයේ දී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 631ක් දක්වා සියයට 3.9ක වර්ධනයක් වාර්තා කළේය. මෙම වැඩි වීම, 2020 වසරේ ජනවාරි සිට ඔක්තෝබර් දක්වා කාලය තුළ දී ලැබූ මුළු විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ප්‍රමාණය එ.ජ. ඩොලර් මිලියන 5,680ක් දක්වා 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 2.6ක වර්ධනයක් වාර්තා කිරීම සඳහා හේතු විය.

**රූප සටහන 8: මාසික සංචාරක පැමිණීම්**




**මූලය**: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

**රූප සටහන 9: සංචාරක ඉපැයීම් සහ විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ**




**මූලයන්**: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, බලපත්‍රලාභී බැංකු, ශ්‍රී ලංකා මහ බැංකුව

## මූල්‍ය ලැබීම්

**රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ තුළ වූ විදේශීය ආයෝජන මාසය තුළ දී සුළු ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය.** 2020 ඔක්තෝබර් මාසයේ දී රුපියල්වලින් නාමනය කරන ලද රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් වූ විදේශීය ආයෝජනවල ශුද්ධ ගෙවීම එ.ජ. ඩොලර් මිලියන 20ක් ලෙස වාර්තා වූ අතර, එමඟින් 2020 වසරේ ජනවාරි සිට ඔක්තෝබර් දක්වා කාලපරිච්ඡේදය තුළ දී සමුච්චිත ශුද්ධ ගෙවීම එ.ජ. ඩොලර් මිලියන 532ක් දක්වා ඉහළ ගියේය. 2020 ඔක්තෝබර් මස වාර්තා වූ මෙම ශුද්ධ ගෙවීම, එ.ජ. ඩොලර් මිලියන 1ක දළ ලැබීමක සහ එ.ජ. ඩොලර් මිලියන 21ක දළ ගෙවීමක ප්‍රතිඵලයකි. රුපියල්වලින් නාමනය කරන ලද රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි නොපියවා ඉතිරිව ඇති මුළු විදේශීය ආයෝජන

ප්‍රමාණය 2020 වසරේ ඔක්තෝබර් මාසය අවසන් වන විට එ.ජ. ඩොලර් මිලියන 56ක සාපේක්ෂ අඩු මට්ටමක පැවතුණි.

**2020 ඔක්තෝබර් මස කොළඹ කොටස් වෙළඳපොළ තුළ ශුද්ධ පදනම මත විදේශීය ආයෝජන ලැබීමක් වාර්තා වූ අතර, රජය වෙත වූ විදේශ ණය ඉහළ ගියේය.** ප්‍රාථමික වෙළඳපොළ සහ ද්විතීයික වෙළඳපොළ යන දෙකම සලකා බැලීමේ දී, කොළඹ කොටස් වෙළඳපොළ 2020 වසරේ ඔක්තෝබර් මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 21ක ශුද්ධ ලැබීමක් වාර්තා කළේය. මෙම ලැබීම, මාසය තුළ දී ප්‍රාථමික වෙළඳපොළ වෙත ලද එ.ජ. ඩොලර් මිලියන 50ක විශාල ලැබීම සහ ද්විතීක වෙළඳපොළ වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 29ක ශුද්ධ ගෙවීමේ ප්‍රතිඵලයකි. සමුච්චිත පදනම මත, 2020 වසරේ ඔක්තෝබර් මාසයෙන් අවසන් වූ මාස දහය තුළ දී කොළඹ කොටස් වෙළඳපොළ එ.ජ. ඩොලර් මිලියන 194ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය. මේ අතර, 2020 වසරේ ඔක්තෝබර් මාසයේ දී රජය වෙත වූ දිගු කාලීන ණය එ.ජ. ඩොලර් මිලියන 185ක ශුද්ධ ලැබීමක් වාර්තා කළේය.

## ජාත්‍යන්තර සංචිත

**ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරයක් පියවීම වශයෙන් විශාල ණය ආපසු ගෙවීමක් පැවතිය ද, දළ නිල සංචිත 2020 වසරේ ඔක්තෝබර් මස අවසානයේ දී ප්‍රමාණවත් මට්ටමක පැවතුණි.** 2020 වසරේ ඔක්තෝබර් මස මුලදී කල් පිරුණු එ.ජ. ඩොලර් බිලියන 1.0ක ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරයක් ආපසු ගෙවීමත් සමඟ, දළ නිල සංචිත ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියන 5.9ක් විය. දළ නිල සංචිත ආනයනික මාස 4.2කට සමාන විය. දළ නිල සංචිත හා බැංකු අංශයේ විදේශීය වත්කම්වලින් සමන්විත වන මුළු විදේශීය වත්කම් ප්‍රමාණය 2020 වසරේ ඔක්තෝබර් මස අවසානයේ දී මාස 6.2ක ආනයන ආවරණය කිරීමට ප්‍රමාණවත් පරිදි එ.ජ. ඩොලර් බිලියන 8.6ක් විය.

**රූප සටහන 10: දළ නිල සංචිත සහ සංචිත ප්‍රමාණාත්මකභාවය**




**මූලය**: ශ්‍රී ලංකා මහ බැංකුව

## විනිමය අනුපාතිකයේ හැසිරීම

**2020 වසරේ ඔක්තෝබර් මාසය තුළ දී ශ්‍රී ලංකා රුපියල, මාසය මැද දී දක්නට ලැබුණු යම් විචලනයකින් අනතුරුව, සියයට 0.7ක සුළු අතිප්‍රමාණය වීමක් වාර්තා කළේය.** සමස්තයක් ලෙස, 2020 දෙසැම්බර් මස 14 වැනි දින දක්වා කාලය තුළ දී රුපියල, එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 2.4ක අවප්‍රමාණයක් වාර්තා කළේය. 2020 ඔක්තෝබර් මාසයේ දී ද විදේශ විනිමය මිලදී ගනිමින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අඛණ්ඩව දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත මැදිහත් වීම් සිදු කරන ලදී. ඒ අනුව, 2020 නොවැම්බර් මස අවසානය දක්වා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ශුද්ධ පදනම මත අවශෝෂණය කර ගත් විදේශ විනිමය ප්‍රමාණය එ.ජ. ඩොලර් මිලියන 305 දක්වා ඉහළ ගියේය. මේ අතර, අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම පිළිබිඹු කරමින් 2020 වසරේ දෙසැම්බර් මස 14 වැනි දින දක්වා කාලය තුළ දී ශ්‍රී ලංකා රුපියල, යූරෝ, ස්ටර්ලින් පවුම, ජපන් යෙන් සහ ඕස්ට්‍රේලියානු ඩොලරයට සාපේක්ෂව අවප්‍රමාණය වූ අතර, ඉන්දියානු රුපියලට සාපේක්ෂව අතිප්‍රමාණය විය.

**රූප සටහන 11: එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියලෙහි අගය**




**මූලය**: ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 4: තෝරාගත් ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි වෙනස්වීම**

| මුදල් ඒකකය | 2019 | 2020 (දෙසැ. 14 දක්වා) අවප්‍රමාණය (-)/ අතිප්‍රමාණය (+) |
|---|---|---|
| එ.ජ. ඩොලරය | +0.6% | -2.4% |
| යූරෝ | +2.6% | -9.8% |
| ස්ටර්ලින් පවුම | -2.8% | -3.7% |
| ජපන් යෙන් | -1.0% | -6.5% |
| ඕස්ට්‍රේලියානු ඩොලරය | +1.3% | -9.2% |
| ඉන්දියානු රුපියල | +2.6% | +1.0% |

**මූලය**: ශ්‍රී ලංකා මහ බැංකුව